සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Remove Watermark Now

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම - 2019
முதலாம் தவணை மதிப்பீடு
First Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | Christianity | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 01 |
|---|---|---|---|---|---|---|---|

**වඩාත් නිවැරදි වරණය තෝරන්න.**

01. පහත සඳහන් අය අතුරෙන් ප්‍රථමයෙන්ම ගාබ්‍රියෙල් දේවදූතයා දර්ශනය වූයේ,
    1. ජෝසෙප්තුමාටය. 2. මරියතුමියටය. 3. සෙකරියස්තුමාටය. 4. රජවරුන්ටය.

02. ජේසුස්වහන්සේට දිළිඳු උපතක් හිමිවූ බව සංකේතවත් කරනුයේ,
    1. ගවලෙන හා එඬේරුන්ය. 2. ශාස්ත්‍රවන්තයන් හා තාරකාවය.
    3. දේවදූතයන් හා ගවඔරුවය. 4. එඬේරුන් හා ශාස්ත්‍රවන්තයන්ය.

03. ස්නාවක ජොහාන්ගේ හා ජේසුස්වහන්සේගේ ජීවිතවල සමානත්වයක් දක්නට ලැබෙනුයේ,
    1.දේශනාවලය 2. පෞරුෂත්වයෙහිය 3. හිමිවූ බලයෙහිය. 4. සේවාවන් අතරය

04. දිවැස් වැකි අනුව 'පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ' යැයි කියනු ලබන්නේ,
    1. දාවිත්ටය 2. ජේසුස්වහන්සේටය 3. ස්නාවක ජොහාන්ටය 4. ආදම්ටය

05. ඉශ්රායෙල් සමාජය පිළිබඳ කරුණු කීපයක් පහත දැක්වේ.
    A-දරුවන් කොන්කළ සමාජයකි C-දසපනත සමග බද්ධව තිබූ සමාජයකි.
    B-ඒකදේවවාදී සමාජයකි. D-සෙලට්වරුන් පාලනය කළ සමාජයකි.

    ඒ අතුරෙන් නිවැරදි වනුයේ,
    1. A හා B ය. 2. A හා C ය. 3. B හා C ය. 4. C හා D ය.

06. දොළොස් හැවිරිදි ජේසුස්වහන්සේගෙන් තරුණ කිතුනුවන්ට ලැබෙන මහඟු ආදර්ශය නම්,
    1. දේවකැමැත්ත වටහා ගනිමින් දේව සේවයට යොමුවීමයි.
    2. නිරතුරුවම ස්වාධීනව කටයුතු කිරීමයි.
    3. වැඩිහිටියන්ට වුවද සිය වරද පෙන්වා දීමයි.
    4. ආගමික පිළිවෙත් නිවැරදිව ඉටුකිරීමට වගබලා ගැනීමයි.

07. ජේසුස් වහන්සේගේ සළුවේ දාවල්ල ස්පර්ශ කිරීමෙන් සුවය ලැබූ කාන්තාව,
    1. කුදු ස්ත්‍රියයි 2. පේදුරුගේ නැන්දනියයි
    3. ජයිරස්ගේ දියණියයි. 4. මහලේරෝගි ස්ත්‍රියයි.

08. ලෝකය තුළ අප ක්‍රියාකාරීත්වයට බලපාන ප්‍රධාන සාධක නම්,
    1. අභිප්‍රායයන් ඉටුකරගැනීම හා සම්පත් වර්ධනය කරගැනීමයි.
    2. සමාජ දර්ශනයට අනුගතවීම හා අනුකරණයයි.
    3. දේව සබඳතාවය හා දෙවියන්වහන්සේට කීකරු වීමයි.
    4. දන්දීම හා නිරතුරුවම භාවනාවෙහි යෙදීමයි.

Papers.lk
pdfelement

Remove Watermark Now

09. සියල්ල අත්හැර දමා ජේසුස්වහන්සේ පසුපස යෑමට ලෙවී පෙළඹවූ ජේසුස්වහන්සේගේ වදන් වූයේ,
    1. "දියඹට ගොස් දැල් හෙලන්න" යන්නයි.
    2. "මා අනුව එන්න" යන්නයි.
    3. "බිය නොවන්න මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇත" යන්නයි.
    4. "ඔබට සාමය වේවා" යන්නයි.

10. ආලේපලත් තැනැත්තා තුළින් ජුදෙව් ජනතාව බලාපොරොත්තු වූයේ,
    1. රාජකීය හා දේශපාලන භූමිකාවකි.
    2. ගුරු භූමිකාවකි.
    3. දිවැසිවර භූමිකාවකි.
    4. පූජක භූමිකාවකි.

11. ජේසුස් වහන්සේ පැවති සමාජ සිරිත් හා සම්ප්‍රදායයන්වලට අනුගත වූ අයුරු පිළිබිඹු වූයේ,
    1. අන්තිම රාත්‍රී භෝජනයෙනි.
    2. කුරුසි පූජාවෙනි.
    3. පුනරුත්ථානයෙනි.
    4. කුඩාරම් මංගල්‍යයෙනි.

12. 'දෙවි සමිඳාණන්ගේ නාමය අගරු ලෙස භාවිත නොකරන්න' යන්න,
    1. දසපනතේ අටවන පනතයි
    2. දසපනතේ පස්වන පනතයි
    3. දසපනතේ නවවන පනතයි
    4. දසපනතේ තුන්වන පනතයි

13. ප්‍රශ්න ගැටළු හා අර්බුද මධ්‍යයේ ක්‍රියාකරන කිතුනු නායකයින්,
    1. නිරතුරුවම සිය දක්ෂතා විදහා දැක්විය යුතුය.
    2. බුද්ධිමත් විසඳුම් කරා යොමුවියයුතුය.
    3. ඇදහිල්ලෙන් දෙවිඳුන් මත යැපිය යුතුය.
    4. සිය අධිකාරී බලය අනුව තීරණ ගත යුතුය.

14. පාවුල්තුමාට අනුව වඩාත් වැදගත් වනුයේ,
    1. අන්‍යභාෂා කතා කිරීමයි.
    2. ප්‍රේමයයි.
    3. බලවත් විශ්වාසයයි
    4. සකල ඥානය හිමිකර ගැනීමයි.

15. ජීවමාන ජේසුස්වහන්සේ හඳුනාගැනීමට අපට උපකාර කරන කාරණා නම්,
    1. ලෞකිකත්වය හා අභියෝගයයි.
    2. දක්ෂතාවය හා ප්‍රබෝධමත් බවයි.
    3. විශ්වාසය හා බලාපොරොත්තුවයි.
    4. අත්දැකීම හා බුද්ධියයි.

16. 'ලුණු' නමැති උපමා රූපකය මගින් ජේසුස්වහන්සේ,
    1. දයාවන්තවීමේ ප්‍රතිවිපාක පෙන්වා දුන් සේක.
    2. පාපයෙන් මිදීමේ අවශ්‍යතාවය වටහා දුන්සේක.
    3. අධිතක්සේරුවෙන් වැළකී සිටීම වැදගත් බව පහදා දුන් සේක.
    4. කිතුනු ජීවිතයේ අභ්‍යන්තර අගයයන් පැහැදිලි කළ සේක.

17. රූප විපර්යාසයේදී දේව අභිමුඛත්වය සංකේතවත් වූයේ,
    1. මෝසෙස් මගිනි.
    2. එලියා මගිනි.
    3. වලාපටලය මගිනි.
    4. කුඩාරම් මගිනි.

18. 'පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහාය' යන උදාර සංකල්පය ක්‍රියාත්මක කරන ලද්දේ,
    1. ගරු තිස්ස බාලසූරිය පියතුමාය.
    2. ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමාය.
    3. ගරු පීටර් පේරාඩ් පියතුමාය.
    4. ගරු මයිකල් රොද්‍රිගු පියතුමාය.

19. 'අයිරේනියා' යන්නෙන් අදහස් වනුයේ,
    1. සංස්කෘතික වට පිටාවය.
    2. අප සිතුම් පැතුම්ය.
    3. සම්පූර්ණ සාමයය
    4. දේව අභිමතයය

Papers.lk pdfelement

20. "මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි" යන ප්‍රකාශය හා සම්බන්ධ යැයි සැලකෙන ප්‍රකාශ කීපයක් පහත දක්වා ඇත.

A - ගැළවීම අද මේ ගෙදරට පැමිණ ඇත.
B - ඔබ බොහෝ දේ ගැන කරදර වෙමින් නළංගු වන්නෙහිය.
C - ඉතාම කුඩා තැනැත්තා ශ්‍රේෂ්ඨතම තැනැත්තාය.
D - මොහු ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි.

ඒ අතුරෙන් නිවැරදි වන්නේ,

1. A හා B ය. 2. B හා C ය. 3. C හා D ය. 4. D හා A ය.

21. මිනිස් සිත් ඇදගැනීමේ චේතනාව ප්‍රබල පරීක්ෂාවකි.' ඒ සඳහා ජේසුස් වහන්සේට එල්ලවූ පරීක්ෂාව නම්,

1. ගල් රොටී බවට පත්කිරීමය. 2. දේවමාළිගය මුදුනින් පහතට පැනීමය.
3. යක්ෂයාට නමස්කාර කිරීමය. 4. වතුර මිදියුෂ බවට පත්කිරීමය.

22. මානුෂිකත්වයට මුල්තැන දීමේ වැදගත්කම ජේසුස්වහන්සේ පරිසි විනයධරයන්ට අවධාරණය කරන ලද්දේ,

1. උපවාස කිරීමේ පිළිවෙත් ඇසුරෙනි. 2. ජුදෙව් ව්‍යවස්ථාව පැවැත්වීම සම්බන්ධයෙනි.
3. දේවමාළිගය ගොඩනැගීම ආශ්‍රිතවය 4. සබත් දින පිළිවෙත් ඉටුකිරීම සම්බන්ධයෙනි.

23. දේව රාජ්‍යයෙහි මූලික ප්‍රතිපත්තිය වන්නේ,

1. නිම්හිම් නොමැති ප්‍රීතිය සොයායෑමයි. 2. කිසිවක් ගැන වෙහෙස නොවීමයි.
3. අසීමිත ලෙස ප්‍රේම කිරීමයි. 4. ප්‍රාතිහාර්යය අපේක්ෂා කිරීමයි.

24. එක් එක් ගස එහි ඵලයෙන් හැඳින්වීමේන් අවධාරණය වන්නේ,

1. විවිධ අනුශාසනාවලට කීකරුවීමේ වැදගත්කමයි.
2. ජීවිත පැවැත්මෙන් ඵල දැරිය යුතු බවයි.
3. නිරතුරුවම නිහතමානීවීමේ අවශ්‍යතාවයයි.
4. නොයෙක් ජාතීන් ඇසුරු කළ යුතු බවයි.

25. ජේසුස් වහන්සේ තුළින් දේව සංරක්ෂණය කෙරෙහි ජනතාවගේ විශ්වාසය තහවුරු වූ අවස්ථාවකි.

1. අන්ධ බාර්තිමෙයස් සුවකිරීම. 2. මාරුත දමනය
3. රූප විපර්යාසය 4. පන්දහසකට කෑම සැපයීම.

26. "මංසන්ධිවල ප්‍රසිද්ධියේ යාච්ඤා කිරීම ඔවුනගේ සිරිතකි. ඔවුහු වස්ත්‍රවල පවා ශුද්ධ ලියැවිලි පාඨ ලියා ගත්හ" මින් කියැවෙන්නේ,

1. විනයධරයන් ගැනය. 2. ඒසීනවරුන් ගැනය
3. සද්දුසිවරුන් ගැනය. 4. පරිසිවරු ගැනය

27. ස්නාවක ජොහාන්තුමා 'පොළොං වංශය' යනුවෙන් සෙනඟ අමතනු ලැබීමෙන්,

1. ඔවුන්ගේ පාපයේ විසකුරු බව හැඟවීය.
2. ඔවුන් උරගයින්ට දක්වන කරුණාව හැඟවීය.
3. ඔවුන් එකම ජනතාවක් බව හැඟවීය.
4. ඔවුන්ගේ සංස්කෘතික වටිනාකම හැඟවීය.

28. ජුදෙව් ප්‍රශංසා ගීත කීපයකට අදාළ කරුණු පහත දැක්වේ.

A-ජුදෙව් බලාපොරොත්තුවක් ඉටුවීම. B-සකළ ජාතීන්ට ගැළවීම.
C-විජාතීන්ට ආලෝකය D-ධනවතුන් හිස් අතින් හැරීම.

මේ අතුරින් සිමියොන්ගේ ගීතයට අදාළ කරුණු වන්නේ,

1. A හා B ය. 2. B හා C ය. 3. C හා D ය. 4. D හා A ය.

Remove Watermark Now
Papers.lk
pdfelement

Remove Watermark Now

29. 'සැනෙඩ්‍රින්' නම් ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වය දරන ලද්දේ,
   1. ආණ්ඩුකාරයාය.   2. ජේසුස්වහන්සේය.
   3. උත්තම පූජකයාය.   4. යුවරජය.

30. දේව රාජ්‍යය උරුම කර ගැනීම සඳහා ළදරුවන් මෙන් විය යුතු බව පැවසීමෙන්, ජේසුස්වහන්සේ අවධාරණය කළ ගුණාංගය වන්නේ,
   1. ඉවසීමයි.   2. නිහතමානී බවයි.   3. කරුණාවන්තභාවයයි.   4. ප්‍රේමයයි.

31. නාසරෙත් ධර්මශාලාවේ දේශනා කිරීම මගින් ජේසුන්වහන්සේ,
   1. සිය උපන් නගරය හා සම්බන්ධතාවය තහවුරු කළ සේක.
   2. සිය පවුල් පරිසරය හෙළි කළ සේක.
   3. සිය සේවයේ ප්‍රතිපත්ති පැහැදිලි කළ සේක.
   4. සිය මෙහෙය පිළිබඳව පැවති වැරදි මත දුරු කළ සේක.

32. ජුදා සමාජයේ තහංචි මගින් පසුබට නොවූ කාන්තාවන් ජේසුස්වහන්සේගේ ශ්‍රාවකත්වය දැරීම සඳහා ඉදිරිපත් වීමෙන්,
   1. ජුදා සමාජයේ පිරිමි අයට නිශ්චිත ස්ථානයක් නොතිබූ බව පැහැදිලි වේ.
   2. ජේසුස්වහන්සේගේ ශ්‍රාවකයන් වීම සඳහා පිරිමි අය ප්‍රයත්න නොදැරූ බව පැහැදිලි වේ.
   3. දේව රාජ්‍යයේ වර්ධනය සඳහා කාන්තාවන්ට දායකත්වය දැක්වීමට ජේසුස්වහන්සේ නිදහස ලබාදුන් බව පැහැදිලි වේ.
   4. වෙනත් රැකියාවන් කිරීමට ජුදෙව් කාන්තාවන්ට නීතිරීති මගින් අවකාශ සලසා නොතිබූ බව පැහැදිලි වේ.

33. සමාජයේ සිදුවන අකටයුතුකම් මධ්‍යයේ ඒවාට සාර්ථකව මුහුණදීම සඳහා ස්නාවක ජොහාන් මෙන්,
   1. දැඩි විවේචන එල්ල කළ යුතුය.   2. අනාවැකි පළකළ යුතුය.
   3. දිරිමත්ව එඩිතරව ක්‍රියාකළ යුතුය.   4. ප්‍රභූ ඇසුරට පත්විය යුතුය.

34. කිතුනු බව්තීස්මය අර්ථවත් කරගැනීම සඳහා ඔබ,
   1. සතිපතා දෙව්මැදුරේ නමස්කාරයට සහභාගී විය යුතුය.
   2. ශුද්ධාත්ම බලය තුළ නව ජීවිත මඟකට පිවිසිය යුතුය.
   3. ක්‍රමවත් දහම් පාසලකට සම්බන්ධ විය යුතුය.
   4. සමාජ විප්ලවයකට මඟපෑදිය යුතුය.

35. 'ඔහු තමාගේම බැටළුවන්ට නම් අඬ ගසා උන් පිටතට ගෙනෙයි.'
   මේ අනුව ජේසුස් වහන්සේ නමැති එඬේරා,
      A-අපගේ සියලු බලාපොරොත්තු සපුරාලන සේක.
      B-අප ශාරීරිකව පෝෂණය කරන සේක.
      C-අප වෙන් වෙන් වශයෙන් හඳුනන සේක.
      D-අප සතුරන්ගෙන් ආරක්ෂා කරන සේක.
   මේ අතුරින් නිවැරදි වන්නේ,
   1. A ය.   2. B ය.   3. C ය.   4. D ය.

36. ඔබේ සතුරන්ට ........................... ඔබට වෛර කරන්නන්ට ....................... පිළිවෙළින් මෙහි හිස්තැන් සඳහා සුදුසු වදන් නම්,
   1. 'යාච්ඤා කරන්න , සෙත් පතන්න' යන්නයි.
   2. 'යහපත කරන්න , ප්‍රේම කරන්න' යන්නයි.
   3. 'සෙත් පතන්න , යහපත කරන්න' යන්නයි.
   4. 'ප්‍රේම කරන්න , යහපත කරන්න' යන්නයි.

pdfelement
Papers.lk

37.

| ස්ථානය | අවස්ථාව | උද්ගත වූ ගැටළුව |
|---|---|---|
| ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය | විනිශ්චය | A – ඔබ සෙනඟ කැරලි ගැසීමට පොළඹවන්නෙක්ද?<br>B – ඔබ ක්‍රිස්තුස්ද?<br>C – මොහු ගලීලයෙක්ද?<br>D – මොහු ජුදෙව්වරුන්ගේ රජුද? |

මේ අතුරෙන් නිවැරදි වන්නේ,

1. A ය. 2. B ය. 3. C ය. 4. D ය.

38. විශ්වාසී හා අවිශ්වාසී දාසයින් පිළිබඳ උපමාවෙන් ඉදිරිපත් කෙරෙන පරිදි දේවරාජ්‍යයේ පුරවැසියන්,

1. වැඩි වැඩියෙන් ලාභ ලබාගත යුතුය.
2. වඩාත් වගකීම් සහිත සේවයක් ඉටුකළ යුතුය.
3. නිරතුරුවම ගැටුම් නිරාකරණය කළ යුතුය.
4. ලෞකික සැපසම්පත් වලින් ඈත්ව දිවි ගෙවිය යුතුය.

39. පහත දැක්වෙන්නේ චරිත ලක්‍ෂණ කීපයකි.

A- කපිකත්වය B-විශ්වාසය C-සංවරශීලී බව. D-ස්ථිර අධිෂ්ඨානය
E-ආචාරශීලී බව F-තැන්පත් බව

1. A හා E ය. 2. B හා C ය. 3. C හා A ය. 4. D හා B ය.

40. කිතුනු අප යාච්ඤා කිරීමේ අරමුණ වන්නේ,

1. අප කිතුනු සභාවට අයත් බැවින් පිළිවෙත් ඉටුකිරීම සඳහාය.
2. අපගේ මානුෂික අවශ්‍යතා දෙවිඳුන්ගෙන් අයැද සිටීමටය.
3. දෙවිඳුන් සමඟ සබඳතාවට ඇතුලත් වෙමින් නිරතුරුවම දේව කැමැත්ත සෙවීමටය.
4. අප සතුරන්ට දැක්‍ෂුවම් පැමිණවීම පිළිබඳව දෙවිඳුන්ට මතක් කර දීමටය.

Remove Watermark Now

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම - 2019
முதலாம் தவணை மதிப்பீடு
First Term Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 11 | |
| විෂයය / பாடம் / Subject | Christianity | |
| පත්‍රය / வினாத்தாள் / Paper | II | |
| පැය / மணித்தியாலம் / Hours | 2 | |


**පහත දී ඇති ප්‍රශ්න අතුරින් පළමු අනිවාර්ය ප්‍රශ්නයට හා 02 - 07 දක්වා ප්‍රශ්න අතුරෙන් කැමති ප්‍රශ්න 4 ක් ඇතුළුව මුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. පැහැදිලි හා නිවැරදි පිළිතුරු සපයන්න.

1. කුළුදුල් ජුදෙව් පිරිමි බිළිඳු දරුවන් වෙනුවෙන් පහත සඳහන් කාලවලදී ඉටුකරනු ලබන පිළිවෙත් නම් කරන්න.
   (a) ඉපදී දින අටක් වූ විට -
   (b) දින හතලිහක් පිරුණු කල -

2. ජුදෙව් ඉතිහාසයේ ආරම්භක සිදුවීම ලෙස සලකන්නේ කුමක්ද?

3. පහත සඳහන් A හා B කොටස් සම්පූර්ණ කරන්න.




4. පරිසිවරු, අමුත්තකු නිවසට පිළිගැනීමේදී අනුගමනය කරන ජුදෙව් චාරිත්‍ර 2 ක් නම් කරන්න.

5. පහත සඳහන් අවස්ථාවල ජේසුස්වහන්සේගේ 'වස්ත්‍ර' වලට සිදුවූයේ කුමක්දැයි ලියාදක්වන්න.
   (a) රූප විපර්යාසය -
   (b) කුරුසිපත්වීම -

6. කිතුනු සභාවට පැවරී ඇති එඬේර වගකීම් 2 ක් ලියන්න.

7. සාමය හා බැඳී පවතින ගුණාංග, 2 ක් ලියාදක්වන්න.

8. හිස්තැන් පුරවන්න.
   ඔබේම ඇසෙහි තිබෙන A...................................... නොබලා සහෝදරයාගේ ඇසෙහි තිබෙන B ...................................... සොයන්නේ මන්ද?

Papers.lk
pdfelement

Remove Watermark Now

9. ශු.සහභාගීකමේ කෘත්‍යය තුළින් එළිදක්වෙන කිතුණු ලක්ෂණ 2 ක් ලියන්න.

10. අසල්වැසියාට ප්‍රේමකිරීම පිළිබඳ ජේසුස්වහන්සේ ඉදිරිපත් කළ නව අර්ථකථනය ලියාදක්වන්න.
(ලකුණු 2  10 =20)

02. 'ජේසුස් වහන්සේ යහපත් බැටළු එඬේරාය.'

1. පැරණි ගිවිසුමේ සඳහන් බැටළු එඬේර ගීතයක් සඳහන් කරන්න. (ලකුණු 2)

2. ජේසුස්වහන්සේ ඉටුකළ එඬේර කාර්යයන් සඳහා නිදසුන් 3 ක් දක්වන්න. (ලකුණු 3)

3. කිතුනු සභාවන් ජේසුස් වහන්සේ අනුගමනය කරමින් එඬේර කාර්යයන්වල නිරතවිය යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)
(මුළු ලකුණු 10)

03. 'ඈ යහපත් දෙය තෝරා ගෙන ඇත.'

1. මෙහි ඈ යනු කවරෙක්ද? යහපත් දෙය කුමක්ද? (ලකුණු 2)
2. ජුදා සමාජයේ කාන්තාවන්ට ජේසුස් වහන්සේ තුළින් යහපත උදාවූ බව දක්වීමට නිදසුන් 3 ක් දක්වන්න. (ලකුණු 3)
3. දේව රාජ්‍යයේ වර්ධනය සඳහා වත්මන් කාන්තාවන්ට දායකත්වය දැක්විය හැකි ආකාරය පහදන්න. (ලකුණු 5)
(මුළු ලකුණු 10)

04. 'ඔවුන් සැඩොක් නමැති පුදෙව්වකුගෙන් පැවත එන බව විශ්වාස කෙරේ. ඔවුහු ධනවත් පූජක පන්තියට සම්බන්ධ වූහ.'

1. ඉහත හැඳින්වීමට අදාළ ආගමික කණ්ඩායම නම් කරන්න. (ලකුණු 2)
2. ඔවුන් ජේසුස්වහන්සේට ඉදිරිපත් කළ ප්‍රශ්න 3 ක් ලියාදක්වන්න. (ලකුණු 3)
3. එම ප්‍රශ්න තුළින් කිතුනු විශ්වාසයට එල්ල වන අභියෝග ජයගත හැකි ආකාරය දක්වමින් වාර්තාවක් ලියන්න. (ලකුණු 5)
(මුළු ලකුණු 10)

05. 'දුක්විඳීම කිතුනු ජීවිතයේ විශේෂ ලක්ෂණයකි.'

1. පැරණි ගිවිසුමෙහි දුක් විඳි පුද්ගලයන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 2)
2. දුක් විඳින සේවකයාණන්ගේ ලක්ෂණ 3 ක් ලියන්න. (ලකුණු 3)
3. දුක්විඳින ඔබේ මිතුරකුට සරණ විය හැකි ආකාරය නිදසුනක් මගින් පහදන්න. (ලකුණු 5)
(මුළු ලකුණු 10)

06. මිටියාවතේ දේශනය ජේසුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨ ඉගැන්වීමකි.

1. මිටියාවතේ දේශනයේ වාර්තා කර ඇති කතුවරයා නම් කරන්න. (ලකුණු 2)
2. මිටියාවතේ දේශනයට අදාළ පහත සඳහන් කරුණු විදහා දක්වෙන ජේසුස්වහන්සේගෙ ඉගැන්වීම ලියාදක්වන්න.
   (a) ස්තුතිවන්තභාවය (b) ශ්‍රද්ධාව (c) පිදීමේ වැදගත්කම (ලකුණු 3)
3. මිටියාවතේ දේශනය මගින් වත්මන් කිතුනුවන්ට ලබාගත හැකි මගපෙන්වීම් 5 ක් ලියාදක්වන්න. (ලකුණු 5)
(මුළු ලකුණු 10)

07. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

1. මුල් ශ්‍රාවකයින් කැඳවීම.
2. ආබ්‍රහම්තුමා ලත් පොරොන්දු
3. ප්‍රේමය පිළිබඳ පාවුල්තුමාගේ ඉගැන්වීම
4. එම්මාවුස් ගමන

(ලකුණු 5  2 =10)

papers.lk
pdfelement